# තංජනගර් ගණදෙවි කෝවිලෙහි කැටයම්වලින් යුත් ශිලා ස්ථම්භ පිළිබඳ අධ්‍යයනයක්

ජී.ජී.එස්. නිසසලා[1]

අනාදිමත් කාලයක සිට ලංකාවේ කලා නිර්මාණ සඳහා විවිධ වූ කලා ආභාස කැටි වී ඇත. එම විවිධ ආභාසවලින් යුත් ශිල්පීය ලක්ෂණ පරම්පරා ගණනාවකට සම්ප්‍රේෂණය විය. විශේෂයෙන්ම ඉන්දියානු කලා ආභාසය අප රටේ ඇතැම් කලා නිර්මාණ තුළින් විශද වේ. ඒ අතරින් එක් කලා නිර්මාණයක් ලෙස තංජනගර් ගණදෙවි කෝවිල දැක්විය හැකිය. මෙම අධ්‍යයනයේ ගැටලුව වූයේ තිස්සමහාරාමයේ පිහිටා තිබෙන තංජනගර් ගණදෙවි කෝවිලෙහි ශිලා ස්ථම්භ දකුණු ඉන්දීය කලා කෘති ආභාසය ඇසුරෙන් නිර්මාණය කර තිබේ ද යන්න අධ්‍යයනය කිරීමය. මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් හා ලිඛිත මූලාශ්‍රය ඇසුරෙන් ලබාගත් දත්ත උපයෝගී කරගනු ලැබීය. ඉන්දියාවේ තංජෝර්නගර් ප්‍රදේශයෙන් ගෙන්වන ලද ද්‍රවිඩ ප්‍රජාව වර්තමාන තිස්සමහාරාම මහසෙන්පුර ග්‍රාමයේ නතර කළ බැවින් ඔවුන්ට දෙවියන් යැදීමට මෙම කෝවිල වර්ෂ 1929 ඉදිකර තිබේ. කෝවිල ඉදිකළ වර්ෂය ගණදෙවි පිළිමය තබා තිබූ ශිලා ආසනයෙහි කොටා ඇත. වසර 91ක් පැරණි මෙම කෝවිලට ඇතුළුවන ස්ථානයේ දෙපස කලාත්මක අයුරින් කැටයම් කරන ලද ශිලා ස්ථම්භ දෙකක් දැකගත හැකිය. ප්‍රදේශයේ ද්‍රවිඩ ගම්වාසීන්ගේ අදහස වන්නේ මෙම කෝවිල දකුණු ඉන්දියානු ආභාසය අනුව ඉදිකරන ලද්දක් බවය. අලංකාර කැටයමින් යුක්ත වූ ලියවන ලද කුළුණු දකුණු ඉන්දියානු ආභාසයයි. ඒ අනුව මෙම කෝවිලෙහි ස්ථම්භ අලංකාර කැටයමින් යුක්තය. ශිලා ස්ථම්භයන්හි පහළම කොටස ගත්කළ ළැග සිටින ඇත් රූපයකි. දකුණු ඉන්දියාවේ කැටයම්වල ද ඇත් රූපය දැකගත හැකිය. තමිල්නාඩු දිස්ත්‍රික්කයෙහි පිහිටි දරාසුරම් නම් කෝවිලෙහි ස්ථම්භයන්හි පහළම කොටස සඳහා ආභරණවලින් සරසන ලද ඇත් රූපය යොදාගෙන ඇත. තංජනගර් ගණදෙවි කෝවිලෙහි ද ආභරණවලින් සරසන ලද ඇත් රූපය යොදාගෙන ඇත. තව ද ස්ථම්භය ඉදිරිපස වැඳගෙන සිටින රජ රුවක් හෝ පූජකයෙක් යැයි උපකල්පනය කළ හැකි රූප දෙකක් කැටයම් කර ඇත. දකුණු ඉන්දියාවේ පිහිටි බ්‍රිහදේශ්වර කෝවිලෙහි එම රුව වස්ත්‍රාභරණ, කර්ණාභරණ ආදියෙන් සරසා කලාත්මක අයුරෙන් නිමවා ඇති අතර එම කැටයම හා සමාන අයුරෙන්ම කලාත්මක බව රැකගනිමින් මෙම කෝවිලෙහි ස්ථම්භ කැටයම් නිරූපිතය. එමෙන්ම වෙන්කටරාමනාන් ගෝපාලන් කෝවිලෙහි ඇතැම් ස්ථම්භවල දැකගත හැකි මෝස්තර රටාවන් ඒ ආකාරයෙන්ම මෙම ගණදෙවි කෝවිලෙහි නිරූපණය වීම සුවිශේෂී වේ. එම කෝවිලෙහි ස්ථම්භයන්හි ද දේවතා රූප කැටයම් කර ඇත. ස්ථම්භ මුදුනේ ජේකඩ දෙකක් දැකගත හැකි අතර ඒ ආකාරයටම ගෝපාලන් කෝවිලෙහි ස්ථම්භයන්හි ජේකඩ නිරූපණය වේ. ඉහතින් දක්වන ලද සංසන්දනාත්මක විග්‍රහය අනුව මෙම තංජනගර් ගණදෙවි කෝවිලෙහි ස්ථම්භ කැටයම් සඳහා දකුණු ඉන්දීය ආභාසය ලැබී ඇති බව මෙම පර්යේෂණයේදී හෙළි වේ.

ප්‍රමුඛ පද : තංජනගර් ගණදෙවි කෝවිල, දකුණු ඉන්දියාව, කැටයම් ශිලා ස්ථම්භ, ආභාසය

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ggnisasala@gmail.com